
තොප්පියක් ආතර් කොනන්ඩොයිල් "මං උපසේන" උපසේනට ගොත ගැසිණි. ගැන.......... තමා ඉදිරියේ මේසය මත දමා ඇඟිල්ලකින්

# 'සාදය මාරයි කෑම හමාරයි' හොඳ ප්‍රහසනයක ගතිලකුණු දනවයි





මේ කාලයේ අපේ සිංහල වේදිකාවේ ප්‍රහසනමය නාට්‍යවලට ඇත්තේ නොමඳ වූ ඉල්ලුමකි. ඒ නිසාම බඩේ බඩවැල් කටින් එන අන්දමටම හිනාවිය හැකි නාට්‍ය හැදෙන ප්‍රවණතාවක් හා නාට්‍ය රැල්ලක් රටේ නිර්මාණය විය....

අරයත් එක්ක බෑ, මෙයත් එක්ක බෑ, කෑම ලෑස්තියි, ගුටි කන්න නියමිතයි ආදී විවිධ නම්වලින් මේ ප්‍රහසන නාට්‍ය රැල්ල ඇදී යද්දී ඒ තුළ "හාස්‍යය" යන රසයේ වටිනාකම ප්‍රශ්න කරන අවර ගණයේ නාට්‍යද බිහි වූ බව පිළිගත යුතුය.

මේ අන්දමේ නාට්‍යවල බොහෝ විට ප්‍රහසනය උපන්නේ කුමක් නිසාද? ප්‍රේක්ෂකයා මේ තරම් හිනා වෙන්නේ කුමක් නිසාද කියන ප්‍රශ්නද මතු විය.

සැබැවින්ම ඒ ගණයේ බොහෝ නාට්‍යවල ප්‍රේක්ෂකයෝ හිනාවෙන්නේ පාත්‍ර චරිතවල ශාරීරික හෝ මානසික අඩුපාඩුවලටය. නැත්නම් නූගත්කම්, නොදැනුවත්කම් හෝ දුර්වලකම්වලටය. උදාහරණයක් වශයෙන් දෙමළ හෝ මුස්ලිම් ජාතිකයෙක් සිංහල කතා කරමින් වචන හසුරුවන ආකාරය හාස්‍යයට ලක්කරන නාට්‍යද තිබිණි.

එහෙත් ලොව දියුණු ගණයේ ප්‍රහසන බිහි වූයේ ඒ මිනිසුන්ගේ දුර්වලකම්වලට නොදැනුවත්කම්වලට හිනාවෙමින් නොව, නාට්‍යමය අවස්ථා අනුව එහි පාත්‍ර වර්ගයා මුහුණ දෙන ගැටුම් හා ගැටලු මත ගොඩනැගෙන පරිසරයටයි. ඒ පරිසරයට පාත්‍ර වර්ගයා මුහුණ දෙන ආකාරය අනුව හාස්‍යය මතු කෙරෙයි.

කලාතුරකින් දක්නට ලැබෙන එබඳු ප්‍රහසනයක් රස විඳින්නට පසුගිය ඉරිදා මට අවස්ථාව ලැබුණේ කොළඹ ලයනල් වෙන්ඩට් රඟහලේදී දිගහැරුණු 'සාදය මාරයි කෑම හමාරයි' නාට්‍යය තුළය. සාපේක්ෂ වශයෙන් යම් යම් නාට්‍යමය දුර්වලතා පෙන්නුම් කළත් හොඳ ප්‍රහසනයක් වේදිකාව මත ගොඩනංගන්නට කළ දුලබ ගණයේ උත්සාහයක් ලෙස අපට මේ නාට්‍යය වැදගත් වෙයි.

සාදය මාරයි කෑම හමාරයි නාට්‍යයේ මේ කිව් ගෞරවයෙන් භාගයක් එහි මව් නිර්මාණයට හිමිවිය යුතුයැයි මම විශ්වාස කරමි. බ්‍රිතාන්‍ය ජාතික සුප්‍රකට ප්‍රහසන නාට්‍යකරු රේ කූනිගේ නිර්මාණ අපට ආගන්තුක නැත. ඔහුගේ "කාන්ට් පේ ඩොන්ට් පේ" නාට්‍යය ඇසුරින් අපේ රටේ නාට්‍යකරුවන් කිහිප දෙනෙක්ම නිර්මාණය කළ නිර්මාණ කිහිපය මීට හොඳ උදාහරණ සපයති. එබඳුම තවත් ප්‍රහසනයක් වූ "මනි මනි" නාට්‍ය ඇසුරෙන් මේ "සාදය මාරයි කෑම හමාරයි" නිර්මාණය වී තිබීම මෙහි ඇති විශේෂත්වයයි.

"මනි මනි" නාට්‍යයේ කතා සාරය ඇසුරෙන් මෙරට සිංහල වේදිකාවේ සිටින අග්‍රගණ්‍ය නළුවකු වන ධර්මප්‍රිය ඩයස් මේ භූමියට අනන්‍ය ලෙස නිර්මාණය කළ සාදය මාරයි කෑම හමාරයි කිසිවිටෙකත් මව් නිර්මාණය විදේශීය එකක් බව විශද නොකරයි. සැබැවින්ම එය අපේම නාට්‍යයක් බව හැඟෙන පරිදි පිටපත ද කතා සාරයද නාට්‍යානුභූතියද නළු නිළියන්ගේ සාර්ථක රඟපෑමද සියල්ල පෙළගැසී තිබෙන අයුරු හරි අපූරුය.

වසර 30 ක පමණ කාලයක් තම මව් රට අතහැර විදේශයක මහත් දුෂ්කරතා මැද දිවි ගෙවන ශ්‍රී ලාංකික යුවළක් වටා ගොඩනැගෙන මෙම කතාව තුළ ගැටුම නිර්මාණය වන්නේ නොසිතූ නොපැතූ මොහොතක, අති විශාල මුදල් සම්භාරයක් මොවුනට අහසින් පාත් වුණාක් මෙන් හිමිවීම තුළය. නෙවිල් හා ලලනි යනුවෙන් හැඳින්වෙන මේ දෙදෙනා එම අනපේක්ෂිත මුදල තමන්ගේ කියන්නට රහස් පොලිස් නිලධාරීන් දෙදෙනෙක්, මිතුරු යුවළක්, ටැක්සි රියැදුරෙක් හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙක් ආදී පිරිසක් සමග එක් රැයක් තුළ ගොඩනගන අරගලය තුළ මේ ප්‍රහසනය මුළුමනින්ම නිර්මාණය වෙයි. සැබැවින්ම මෙය එකක් වහන්නට එකක් වශයෙන් ගොඩනගන ලද බොරු වරුසාවක් හරහා ගොඩනගන නාට්‍යයක් යැයි කිවාට වරදක් නැත. ප්‍රහසනය නිර්මාණය වන්නේ මේ නාට්‍යමය ගැටුමේ "සත්‍ය කතාව" ප්‍රේක්ෂකයා දැනගෙන සිටීමත් නාට්‍යයේ පාත්‍ර වර්ගයා එය නොදැන සිටීමත් තුළය.

නාට්‍යය නරඹන විට එහි චරිත කතාබහ කරන දෙබස් තුළ අර්ථ සංවරයක් තිබුණේ නම් මැනවියි සිතෙන අවස්ථා තිබිණි. විශේෂයෙන්ම ප්‍රශ්න මතුවන්නේ පවුලේ දෙමාපියන්, පොඩි දරුවන් හා පැමිණ නාට්‍යය නරඹන විටය. වේදිකාව මත විකාශනය වන යම් යම් සමලිංගික මානව සම්බන්ධතා පෙන්නුම් කෙරෙන දෙබස් ඛණ්ඩ තුළ පුංචි දරුවනට නොතේරෙන කරුණු තිබේ. දරුවන් ඒවා පෙරළා දෙමාපියන්ගෙන් ඇසුවහොත් ඊට දෙන්නට උත්තර නැතිව දෙමාපියෝ අසරණ වන තැන්ද ඇති බව කිවයුතුය. මා මෙය කියන්නේ අත්දැකීමෙනි. දෙබස්වල අර්ථ සංවරය ඉතා වැදගත්ය.

ඒ පුංචි පුංචි කාරණා හැරුණු විට හොඳ ප්‍රහසනයක් රසවිඳින්නට ලද අවස්ථාව ගැන සතුටුවිය හැකි නාට්‍යයක් ලෙස අපට සාදය මාරයි කෑම හමාරයි සැලකිය හැකිය.

මේ නාට්‍යයේ "නම" ද රැල්ලට ගිය එකක් බව පැහැදිලිය. එහෙත් හාස්‍ය නාට්‍ය රැල්ලෙන් මදක් මිදී අර්ථසම්පන්න ප්‍රහසනයක අත්දැකීම ලබාදීමට නම් හානියක් කර නොමැති බව ද මට සිතෙයි.

අර්ථ සම්පන්න හොඳ ප්‍රහසනයක ලක්ෂණ විදහාපාන්නට අද ලාංකික වේදිකාවේ සිටින සුපිරිතම නළු නිළියන් වන ගිහාන් ප්‍රනාන්දු, ජයනි සේනානායක, දයාදේව එදිරිසිංහ, ගිරිරාජ් කෞශල්‍ය, ආලෝක සම්පත් ඇතුළු නළු නිළියන් දැක්වූ දායකත්වය සුළුපටු නොවන බවද කියමි.

■ මුලිත ප්‍රදීප් කුමාර